**අපි වෙනුවෙන් අපි අරමුදල - 2014**

**-----------------------------------**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යනාදියෙන් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කළේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 අහිතකර මතය**

**-----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත්බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට අපි වෙනුවෙන් අපි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය

ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ නිවාස ඉදිකිරීම් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබාදී තිබුණු රු.136,000,000 ක මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට රු.127,305,345ක් පමණක් වියදම් කර තිබුණද මුළු මුදලම වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ඉතිරි වූ රු.8,694,655කින් වියදම් වැඩියෙන් හා ලැබිය යුතු මුදල් අඩුවෙන් දැක්වීම සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂවලදී මිලදී ගෙන තිබුණු එකතුව රු.1.713,542 ක් වූ මෙවලම් හා උපකරණ ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කිරීම නිසා අදාල වර්ෂ සඳහා ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 | 2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.14,330,738 ක් වූ ජංගම නොවන වත්කම් හා වටිනාකම රු.1,713,542 ක් වූ තොග සම්බන්ධව භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) 2008 පෙබරවාරි 19 දිනැති අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 8 වෙනි වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලය රැස්වීම් පවත්වා නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

----------------------------------------------------------------

භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩාගාර බිල්පත්වල රු.141,651,981 ක් හා ස්ථාවර තැන්පත්වල රු.593,947,151 ක් ආයෝජනය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.77,029,760 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.67,310,121 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.144,339,881 ක පිරිහීමක් දක්නට ලැබුණි. ආදායම රු.135,126,960 කින් අඩුවී තිබියදීත් තවදුරටත් වියදම් රු.9,212,921 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.2** **ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3** **අයවැය ලේඛනමය පාලනය**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබූ අතර 4.1 (ඇ) වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.430,555,025 ක ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දරා තිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර කළමනාකරණයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) මූල්‍ය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) අයවැය පාලනය